**අක්කරෙයිපත්තු මහ නගර සභාව**
**අම්පාර දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 මාර්තු 03 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව හා විස්තරාත්මක කළමණාකරණ වාර්තාව 2020 මැයි 29 දින මහ සභාවට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට අක්කරෙයිපත්තු මහ නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ අයකළ යුතු රු.601,528 ක වරිපනම් හා බදු සහ රු.2,803,219 ක කුලි මුදල්, ආදායම් හා වියදම් ගිණුමේ දක්වා නොතිබුණි. | අයවිය යුතු ආදායම් ගිණුම්ගත කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ ලැබී තිබූ පසුගිය වර්ෂයට අදාල පොළී ආදායම් රු.784,386ක් සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස දක්වා තිබුණි. | වර්ෂයට වූ අදාල වර්ෂයේ ආදායම් හා වියදම් නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |
| (iii) | ඉඩම් හා ගොඩනැගිලි ශේෂය තුළ මාර්ග පිරිවැය රු.310,828 ක් ඇතුළත්ව තිබුණු අතර, රු.526,054 ක් වූ ගොඩනැගිලි අලුත්වැඩියා වියදම් ප්‍රාග්ධන වැයක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | වියදම්, නියමිත වැය විෂයය ගිණුම යටතේ වර්ගීකරණය කොට පෙන්විය යුතු වේ. | උක්ත ඉඩම් හා ගොඩනැගිලි ශේෂය තුළ වැරදීමකින් මාර්ග පිරිවැයද ඇතුළත් වී තිබුණි. මෙය නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු කර ඇති බව දන්වා සිටිමි. ගොඩනැගිලි අළුත්වැඩියා වියදම් සම්බන්ධයෙන් නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. |
| (iv) | වාහන 18 ක වටිනාකම තක්සේරු කර ගිණුම්වල දක්වා නොතිබුණි. | වාහනවල වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කළ යුතු වේ. | සියළුම වාහනවල වටිනාකම තක්සේරු කර ගිනුම්ගත කිරීමට මඩකලපුව දිස්ත්‍රික් ආදායම් තක්සේරු දෙපාර්තමේන්තුව වෙත 2019.01.09 දිනැති ලිපිය මගින් ඉල්ලීම් කර තිබුණි. |

| | | | |
|---|---|---|---|
| (v) | 2018 වර්ෂයේ අබලි ද්‍රව්‍ය විකිණීමෙන් ලද මුදල රු. 80,650 ක් ලෙස දක්වා තිබුණද, එම වත්කම්වල පිරිවැය ගිණුම්වලින් ඉවත්කර නොතිබුණි. | එම වත්කම්වල පිරිවැය ගිණුම්වලින් ඉවත් කිරීමට කටයුතු කළ යුතු වේ. | මෙය නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු කරනු ලැබේ. |

**1.4** **අනුකූල නොවීම**

**-----------------**

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.**

**---------------------------------------------------------------------------**

| **නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව** | **අනුකූල නොවීම** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| (අ) මහනගර සහ ආඥා පනතේ 218 වගන්තිය | පරිපාලනය පිළිබඳ වාර්තාවක් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පිළියෙල කර නොතිබුණි. | පරිපාලනය පිළිබඳ වාර්තාව පිළියෙල කිරීමට කටයුතු කළ යුතු වේ. | පරිපාලනය පිළිබඳ වාර්තාව පිළියෙල කරමින් පවති. |
| (ආ) මොටර් රථ ප්‍රවාහන පනතේ 203 වන වගන්තිය | වාර්ෂිකව සියළුම වාහන සඳහා ආදායම් බලපත්‍ර ලබා ගතයුතු වූවද, සභාව විසින් ප්‍රයෝජනයට ගන්නා වාහන 13 ක් සඳහා ආදායම් බලපත්‍ර ලබාගෙන නොතිබුණි. | ආදායම් බලපත්‍ර ලබාගැනීමට කටයුතු කළ යුතු වේ. | වර්තමානයේ ඒවා ලබා ගැනීමට කටයුතු කර ඇත. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>-------------------- | | | |
| (i) මුදල් රෙගුලාසි 189 | 2014 වර්ෂයේ කුලී සඳහා ලැබී තිබූ රු.45,255ක චෙක්පත බැංකුවෙන් ප්‍රතික්ෂේප කර තිබුණත් මේ සඳහා මුදල් ලබාගැනීම් කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසියට අනුකූලව කඩිනමින් කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |
| (ii) මුදල් රෙගුලාසි 396 | ගෙවීම සඳහා ඉදිරිපත් නොකළ මාස 06 ඉක්මවා තිබූ රු.47,403 ක් වටිනා චෙක්පත් 11 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | ගැලපීම් කිරිමට කටයුතු කළ යුතු වේ. | අදාල අයට සිහිකැඳවීම් යවා එම චෙක්පත් මාරු නොකළේ නම් ඒවා ආදායමට මාරු කිරිමට කටයුතු කර ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | (iii) මුදල් රෙගුලාසි 571 | වර්ෂ දෙකක් ඉක්ම වූ රු.105,000 ක් වටිනා ලංසු තැන්පත් නිරවුල් කිරීමට හෝ ආදායමට මාරු කිරීමට කටයුතු කර නොතිබුණි. | ආපසු ගෙවීමට හෝ ආදායමට මාරු කිරීමට කටයුතු කළ යුතු වේ. | අදාල මුදලින් වර්ෂ දෙකක් ඉක්මවූ ටෙන්ඩර් තැන්පතු ආදායමට ගැනීමට කටයුතු කරන බව දන්වා සිටිමි. |
| (ඈ) | 1958 ජුනි 01 දිනැති හා 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදලේ පරිච්ඡේදය 623, 3(1) වගන්තිය | 2018 හා 2019 වර්ෂ සඳහා සේවක අර්ථසාධක අරමුදලට ගෙවිය යුතු දායක මුදල් රු.144,117 ක් 2020 මැයි 15 දින වන විටත් අරමුදලට ප්‍රේෂණය නොකර පොදු තැන්පත් ගිණුමේ රඳවා තිබුණි. | සේවක අර්ථසාධක අරමුදලේ දායක මුදල් නියමිත කාලය තුළ අරමුදලට යැවිය යුතු වේ. | සේවක අර්ථසාධක අරමුදලේ දායක අංක නොලැබීම නිසා දායක අංක ලැබෙන තුරු පොදු තැන්පත් ගිණුමේ තැන්පත් කර තිබුණි. මේවා ආපසු ගෙවීමට කටයුතු කරමින් පවතී. |
| (ඉ) | 1980 ඔක්තෝබර් 29 දිනැති 1980 අංක 46 දරන සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් පනතේ II පරිච්ඡේදයේ 16(1) වගන්තිය | 2018 වර්ෂය වෙනුවෙන් සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට ගෙවිය යුතු දායක මුදල් රු.26,928 අරමුදලට ප්‍රේෂණය නොකර පොදු තැන්පත් ගිණුමේ තැන්පත් කර තිබුණි. | සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට දායක මුදල් නියමිත කාලය තුළ අරමුදලට යැවිය යුතු වේ. | සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් දායක අංක නොලැබීම නිසා දායක අංක ලැබෙන තුරු පොදු තැන්පත් ගිණුමේ තැන්පත් කර තිබුණි. මේවා කම්කරු දෙපාර්තමේන්තුවට ආපසු ගෙවීමට කටයුතු කරමින් පවතී. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.16,429,240 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 15,321,575 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2019 ඇස්තමේන්තුගත ආදායම | 2019 බිල්කළ ආදායම | 2019 රැස්කළ ආදායම | 2019 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2018 ඇස්තමේන්තුගත ආදායම | 2018 බිල්කළ ආදායම | 2018 රැස්කළ ආදායම | 2018 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 10,125,000 | 10,002,000 | 9,400,472 | 37,471,096 | 10,100,000 | 19,089,724 | 7,462,795 | 36,869,569 |
| කුලී | 22,181,224 | 22,596,023 | 19,790,804 | 21,443,890 | 16,557,920 | 15,785,506 | 2,407,855 | 18,638,671 |
| බලපත්‍ර ගාස්තු | 3,125,000 | 3,456,380 | 3,456,380 | -- | 2,650,000 | 2,265,010 | 2,265,010 | -- |
| අනෙකුත් ආදායම් | 14,975,000 | 10,612,631 | 15,466,737 | 2,589,562 | 11,450,000 | 3,165,283 | 9,581,698 | 7,443,668 |
| | **50,406,224** | **46,667,034** | **48,114,393** | **61,504,548** | **40,757,920** | **40,305,523** | **21,717,358** | **62,951,908** |

## 2.2.2 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වරිපනම් ඒකක 12,873 කින් සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා අයවිය යුතු වරිපනම් එකතුව රු.46,869,569 ක් වුවද, සියයට 20 ක් හෙවත් රු.9,398,472 ක් පමණක් සමාලෝචිත වර්ෂය තුල අයකර තිබුණි. | වරිපනම් බදු අයකිරීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදි ක්‍රියාමාර්ගයන් මා විසින් ගෙන වරිපනම් හා බදු අය කිරීමේ ප්‍රතිශතය 85%ක් දක්වා වැඩි කිරීමට කටයුතු කර ඇත. |

## 2.2.3 කුලී

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 1992 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා වූ කාල පරිච්ඡේදයට අදාල වෙළෙඳ පොල බදු කුලී රු.19,105,939කින් සියයට 60 ක් හෙවත් රු.11,508,809 ක් පමණක් අයකර තිබුණි. | ඉකුත් වර්ෂයේ හිඟ මුදල් සමග සමාලෝචිත වර්ෂයේ බදු කුලී ආදායම්ද අයකිරීමට කටයුතු කළ යුතු වේ. | අදහස් ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) | 1994 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා වූ කාල පරිච්ඡේදයට අදාල වාහන නැවතුම් කුලී රු. 439,680 කින් සියයට 20ක් හෙවත් රු. 91,500 ක් පමණක් අය කර තිබුණි. | ගිවිසුමේ කොන්දේසි අනුව කුලී මුදල නියමිත කාලය තුළ ගෙවීම් පැහැර හැරීම් සම්බන්ධයෙන් කටයුතු කළ යුතු වේ. | අදහස් ඉදිරිපත් කර නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අයවිය යුතු හිඟ කඩ කාමර කුලි රු.16,568,722 කින් සියයට 22 ක් හෙවත් රු.3,665,201 ක් පමණක් අයකර තිබුණි. | ඉකුත් වර්ෂයේ හිඟ මුදල් සමග සමාලෝචිත වර්ෂයේ කුලි ආදායම්ද අයකිරීමට කටයුතු කළ යුතු වේ. | අක්කරෙයිපත්තු මහනගර සභාවේ සේවයේ නියුතුව සිටි ආදායම් නිලධාරීන් (RS) සේවයෙන් විශ්‍රාම ලබා ඇත. එම තනතුරට කිසිවෙකුත් පත්කර නොමැත. මේ නිසා ඔබ විසින් සඳහන් කළ කාල පරිච්ඡේදයේ ආදායම් අයකර ගැනීම්වල අඩුපාඩු සිදුවී තිබුණි. |
| (ඈ) | පොදු වෙළෙඳ පොලේ කඩකාමර 167ක හිඟ කුලි රු.4,250,121ක් අයකර ගැනීමකින් තොරව පැවැතුනි. | පොදු වෙළෙඳ පොලේ කඩකාමර හිඟ කුලි සමග සමාලෝචිත වර්ෂය සඳහා කුලි ආදායමත් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | අක්කරෙයිපත්තු මහනගර සභාව 2019.05.27 දින ලිපි මගින් කඩකාමර හිමියන්ට හිඟ කුලි ගෙවන ලෙසට ලිපි යවා තිබුණත් ඇතැම් අය හිඟ කුලි ගෙවා නොතිබුණි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වර්ෂ නවයකට පෙර සභාවේ සේවකයෙකුට සහ ප්‍රජා මධ්‍යස්ථානයට ලබාදී තිබූ රු. 106,003 ක අත්තිකාරම් මුදල් දෙකක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අත්තිකාරම් පියවීමට/ ගිණුම්වලින් කපා හැරීමට කටයුතු කළ යුතු වේ. | අදහස් ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) | 2012 සිට 2018 වර්ෂය දක්වා සේවය අත්හිට වූ නිලධාරීන් 05 දෙනෙකුගෙන් අයකර ගත යුතු රු.155,851 ක ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | නිලධාරීන්ගේ හිඟ ණය ශේෂ අයකර ගැනීමට අඛණ්ඩ ක්‍රියාමාර්ග ගත යුතුවේ | සේවය අත්හිටවූ නිලධාරීන්ගෙන් අදාල හිඟ ණය මුදල් අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇත. |
| (ඇ) | සභිකයෙකු අවස්ථා 02 කදී සහ නියෝජ්‍ය නගරාධිපති එක් අවස්ථාවකදී කිසිදු දැනුම්දීමක් නොමැතිව සභා රැස්වීම් සඳහා සහභාගී නොවී තිබූ නමුත්, රු.65,000 ක දීමනා ගෙවා තිබුණි. | ගැසට් පත්‍ර නිවේදනය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | මෙම ක්‍රියාව වැරදි බැවින් එම ගෙවීම් ආපසු අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. |

**3.2 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | අනුමත සේවක සංඛ්‍යාව තුල තනතුරු පුරප්පාඩු 59 ක් පැවතුනි. | පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | පුරප්පාඩු පිරවීම සම්බන්ධයෙන් පළාත් පාලන දෙපාර්තමේන්තුව සහ පළාත් පාලන අමාත්‍යාංශය දැනුවත් කර ඇත. |
| (ආ) | සෞඛ්‍ය වෛද්‍ය අධිකාරි, මහජන සෞඛ්‍ය පරික්ෂක සහ පවුල් සෞඛ්‍ය නිලධාරි යනාදි අය ස්ථිර වශයෙන් නොතිබුණි. | පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු වේ. | පුරප්පාඩු පිරවීම සම්බන්ධයෙන් පළාත් පාලන දෙපාර්තමේන්තුව සහ පළාත් පාලන අමාත්‍යාංශය දැනුවත් කර ඇත. |
| (ඇ) | 2012 වර්ෂයේ විශ්‍රාම ගිය සහ 2007 වර්ෂයේ මියගිය නිලධාරීන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු රු.118,997 ක් අයකර ගෙන නොතිබුණි. | හිඟ මුදල් අයකර ගැනීමට ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතු වේ. | විශ්‍රාම ගිය නිලධාරියා සහ මිය ගිය නිලධාරියාගේ ඇපකරුවන්ගෙන් හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරමින් පවති. |

**3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතාවය**

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2019 වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා සෑම මාසයකම අවසානයේදී බැංකු ජංගම ගිණුමේ රු.මිලියන 14.0 සිට රු.මිලියන 20.1 ක් දක්වා පරාසයක් තුළ මුදල් ශේෂ පැවතුනි. මෙම අතිරික්ත මුදල් ඵලදායිව ආයෝජනය කිරීමට කටයුතු කර නොතිබීමෙන් සැලකිය යුතු ආදායමක් අහිමි වී තිබුණි. | වැඩිපුර මුදල් විධිමත් අයුරින් අනුමාන කර ආදායම් ඉපැයීමේ කෙටි කාලින තැන්පත්වල ආයෝජනය කිරීමෙන් සභාවේ ආදායම් වැඩිකර ගත යුතු වේ. | මුදල් පොතේ ශේෂය, වැටුප් ප්‍රතිපූර්ණය, ලංසු තැන්පත් ආදියත් අන්තර්ගත කර හා සභාවේ පුනරාවර්තන වියදම් සඳහා ද්‍රවශීලිතාවය පවත්වාගෙන යාම සඳහාත් මෙම මුදල් ශේෂය පවත්වා තිබුණි. |
| (ආ) | මාළු වෙළෙඳපොල කඩකාමර 48 ක්, නව ගොඩනැගිලි කඩකාමර 48 ක්, බස් නැවතුම්පළ කඩකාමරයක් සහ මහනගර සභා උද්‍යාන කඩකාමර 06 ක් කුලියට ලබා දී නොතිබුණි. | කඩකාමර කුලියට දීමට මහනගර සභාව කටයුතු කළ යුතු මෙන්ම මහනගර සභාව විසින් කඩකාමර මගින් ආදායම් අඛන්ඩව ලබාගැනීමට ද කටයුතු කළ යුතු වේ. | මෙම කඩකාමර කුලියට දීමට සෑම වර්ෂයක් අවසානයේදීම අයදුම් පත්‍ර කැඳවා තිබුණි. නමුත් කිසිවෙකුත් කඩකාමර කුලියට ගෙන නොතිබුණි.<br><br>තවද, ඇතැම් කඩකාමර බදු දිය නොහැකිව ඇත. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | කඩකාමර 47 ක කුලී ගිවිසුම් 2018 වර්ෂයෙන් අවසන් වුවත්, ඒවා අලුත් කිරීමට 2020 මැයි 15 දින වන විටත් කටයුතු කර නොතිබුණි. | කුලී ගිවිසුම් අලුත් කළ යුතු මෙන්ම, මහනගර සභාව කඩකාමර මගින් ආදායම් අඛණ්ඩව ලබාගැනීමට ද කටයුතු කළ යුතු වේ. | අක්කරෙයි පත්තු මහනගර සභාව විසින් කුලියට දුන් කඩකාමර 195කින් කඩකාමර 148ක් (දෙවන වර විවෘත කරන ලද අය) ගිවිසුම් නැවත අලුත් කරන ලදි. කඩකාමර හිමියන් 47 දෙනෙකු (දෙවන වර විවෘත කරන ලද අය) පමණක් ගිවිසුම් නැවත අලුත් නොකරන ලදි. |

**3.4 වත්කම් කළමනාකරණය**

**නිෂ්ක්‍රිය / ඌන උපයෝජිත වත්කම්**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2014 වර්ෂයේදී ගිනි නිවන අංශයක් ආරම්භ කිරිම සඳහා රු. 19,882,270 ක් වැයකර ඉදිකරන ලද ගොඩනැගිල්ලක ඉදිකිරිමේ කටයුතු අවසන් නොකළ තත්ත්වයෙන් වර්ෂ 06 ක කාලයක් පුරා අත්හැර දමා තිබුණි. | ඉදිකිරීම් වැඩ අවසන් කිරිමට කටයුතු කර අදාල අරමුණු සඳහා භාවිතා කළ යුතු වේ. | 2014 වර්ෂයේ පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශය විසින් ගිනි නිවීමේ ඒකකයක් ස්ථාපිත කිරීමට මූල්‍ය ප්‍රතිපාදන සලසා කාර්යයන් ක්‍රියාත්මකව පැවති අවස්ථාවේදී, 2015 වර්ෂයේ සිදුවූ රජය වෙනස්වීම හේතුවෙන් අවසන් නොවී පැවතුණි. මේ දක්වා ප්‍රතිපාදන ලැබී නොතිබුණි. අමාත්‍යාංශයෙන් ප්‍රතිපාදන ලැබූ වහාම ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතු අවසන් කිරීමට ක්‍රියා කරනු ලැබේ. |
| (ආ) | ඝණ අපද්‍රව්‍යවලින් කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය කිරීම සඳහා 2018 වර්ෂයේදී රු.999,500 ක් වැයකර මිලදිගෙන සවිකර තිබූ යන්ත්‍රය 2020 මැයි 15 දක්වා සම්පූර්ණයෙන් ප්‍රයෝජනයට ගෙන නොතිබුණි. | නැවතත් මෙම ක්‍රියාකාරකම් ආරම්භ කිරිමට කටයුතු කළ යුතු වේ. | පොහොර ගැරීමේ යන්ත්‍රයත් සම්පූර්ණයෙන් ක්‍රියාත්මකව එක්රැස් කළ Compost File ආදිය ගැරීමටත් ජනතාවගේ විරෝධය දැක්වීම් හේතුවෙන් කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය කඩිනම් කිරීමට නොහැකි විය. කෙසේ වෙතත් ඉදිරියේදි මේවා වෙනත් ස්ථානයකට රැගෙන යාමට හෝ ජනතාව සහ උසස් නිලධාරීන් සමග සුහදශීලී සාකච්ඡා පැවැත්වීමෙන් එම ස්ථානයේම කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය පුළුල් කිරීමට සැලසුම් කර ඇත. |
| (ඇ) | නෙල්සිප් වැඩසටහන යටතේ ළමා උද්‍යානයේ ස්ථාපිත කර තිබූ විදුලි දුම්රිය 2018 වර්ෂයේ සිට අක්‍රිය තත්ත්වයේ පැවතීම නිසා රු.මිලියන 2.3 ක මුදලක් අනාර්ථික වී තිබුණි. | ළමා විදුලි දුම්රිය සක්‍රීය තත්ත්වයට පත්කර ආදායම් ඉපැයීමට කටයුතු කළ යුතු වේ. | ළමා උද්‍යානයේ ඇති ළමා දුම්රිය අළුත්වැඩියා කර අඛන්ඩව ක්‍රියාත්මක කිරීමටත් ඇස්තමේන්තු සකස් කර ඇත. අරමුදල් ලැබීමෙන් අනතුරුව කඩිනමින් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ලැබේ. |

## 3.5 නඩත්තු හා අළුත්වැඩියා සිදු කිරීමට අපොහොසත් වීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වතුර බවුසර් දෙකක්, ට්‍රේලර්, චේන් එක්ස්කැවේටරයක්, යතුරපැදි 03 ක්, ට්‍රැක්ටර් 04 ක් සහ ලොරියක් වශයෙන් අලුත්වැඩියා කිරීමකින් තොරව නිෂ්කාර්යව පැවතුනි. | අලුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට හෝ අපහරණය කිරීමට කටයුතු කළ යුතු වේ. | තක්සේරු කිරීමට කමිටුවක් පත්කර ඇත. මෙම කමිටුවේ වාර්තාව ලැබූ වහාම අළුත්වැඩියා කිරීමට හෝ හෝ නැතහොත් වෙන්දේසියේ විකිණීමට කටයුතු කරන බව දැනුම් දෙමි. |

## 3.6 ප්‍රසම්පාදන සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 වර්ෂය සඳහා පුනරාවර්තන වියදම් වලට ඇතුලත් සැපයුම් හා සේවා හා අලුත්වැඩියා සඳහා රු.මිලියන 15.5 ක් සහ මූලධන වියදම් සඳහා රු.මිලියන 21කුත් ඇස්තමේන්තු කර තිබුණත්, සභාව විසින් ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙළ කර ක්‍රියාත්මක කළ යුතු වේ. | 2019 වර්ෂයට සකස් කළ ඇස්තමේන්තුවට අනුකූලව ප්‍රසම්පාදන සැලැස්මක් සකස් නොකරන ලදි. මේ පිළිබඳව දැනුම අප සභාවේ නිලධාරීන්ට නොමැති හෙයින් මෙම සැලැස්ම සකස් කර ක්‍රියාත්මක කර නොතිබුණි. නමුත්, ඉදිරි වර්ෂය සඳහා විධිමත් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කරනු ලැබේ. |